# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

11 ශ්‍රේණිය

## ශිල්ප කලා - I / II

නම/ විභාග අංකයඃ ......................................... කාලය පැය 3 යි

### ශිල්ප කලා - I කොටස

- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

01) දෘශ්‍ය කලා ශ්‍රව්‍ය කලා හා ශ්‍රව්‍ය දෘෂ්‍ය කලා වශයෙන් ජන කලාව මුහුණුවර ආකාර 3කින් දැකිය හැකිය. දෘෂ්‍ය කලාවක් ලෙස දැක්විය හැක්කේ මින් කුමක්ද?

1) ගොයම් කවි  2) ශාන්තිකර්ම  3) ලාක්ෂා  4) කුළු නැටුම්

02) සකස් කරන ලද ඇටවුමක රූපයක් පහත දැක්වේ. එහි ABC කෝණයේ අගය දළ වශයෙන් මැන ගැනීමට උපකාරී වන උපකරණය වන්නේ




1) මිනුම් කෝදුව  2) කෝණමානය
3) විහිත චතුරස්‍රය  4) සමමිතික වූ රේඛාවය

03) විශ්ව භාෂාවක් ලෙස කාර්මික ඇඳීමේදී ඊට අදාළ සියලුම තොරතුරු දක්වන්නේ සම්මත රේඛා හා සංකේත වලිනි. අඳින ලද රූපයක ඝන අඛණ්ඩ රේඛා වලින් දැක්වෙන්නේ එහි

1) පෙනෙන දාරයි  2) සැඟවුණු දාරයි
3) මිනුම් රේඛායි  4) සමමිතික වූ රේඛායි

04) ඉතාම නිවැරදි නිර්මාණ සිදුකිරීමට ජ්‍යාමිතික උපකරණ භාවිතා කළ යුතුමයි. පහත නිර්මාණයෙන් දැක්වෙන්නේ




1) ඉහළ නැගීමට සැකසූ මෙවළමකි
2) බඩු ඉහළ පහළ ගෙන යා හැකි ඇටවුමකි
3) වහලයක සෙවිලීමට යොදා ගත් එකතුවකි
4) සරල රේඛාවක් සමාන කොටස් වලට බෙදීමකි

05) නිර්මාණ ක්‍රියාවලියේ දී වෘත්ත ආශ්‍රිත හැඩතලද යොදා ගැනේ. යම්කිසි අචල ලක්ෂ්‍යයකට සමදුරින් පිහිටි තවත් ලක්ෂ්‍යයක ගමන් පථය හඳුන්වනු ලබන්නේ

1) ලම්භකය ලෙසය  2) පරිධිය ලෙසය
3) අරය ලෙසය  4) ජ්‍යාය ලෙසය

06) පාද දෙකක ශීර්ෂ හමුවීමෙන් සෑදෙන රූපය කෝණයක් ලෙස නම් කෙරේ. පාද දෙකකට වැඩි ගණනක් සමන්විත වූ සංවෘත තල රූප පොදුවේ හඳුන්වන නාමය වන්නේ

1) වෘත්තය ලෙසය  2) පරිපථය ලෙසය
3) අභිලම්භය ලෙසය  4) බහු අස්‍රය ලෙසය

07) පාද 4ක ශීර්ෂ එකිනෙක මුණ ගැසීමෙන් හැදෙන සංවෘත තල රූපය චතුරස්‍රයක් ලෙස හැඳින්වේ. පහත දැක්වෙන රූපය හඳුන්වනු ලබන නිවැරදි නාමය වන්නේ



1) සමචතුරස්‍රය  2) ත්‍රපීසියම
3) ඍජුකෝණාස්‍රය  4) රොම්බසය

08) ජ්‍යාමිතික හැඩතල විවධ ලක්ෂණ පෙන්වයි. පහත දැක්වෙන රූපය පිළිබඳව නිවැරදි ප්‍රකාශය මින් කුමක්ද?



1) ඍජුකෝණාස්‍රයකි. එහි සම්මුඛ පාද සමාන හා සමාන්තර වේ. කෝණ සමාන වේ.
2) රොම්බසයකි. සම්මුඛ කෝණ හා පාද සමාන වේ. සම්මුඛ පාද සමාන්තර වේ.
3) රොම්බසයකි. සම්මුඛ පාද සමාන හා සමාන්තර වේ. සම්මුඛ කෝණ සමාන වේ.
4) සමචතුරස්‍රයකි. පාද හා කෝණ එකිනෙක සමාන වේ. විකර්ණ ඍජුකෝණීව සමච්ඡේදනය වේ.

09) කාර්මික ඇඳීම තල ජ්‍යාමිතිය හා ඝන ජ්‍යාමිතිය වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. පහත රූපයෙන් දැක්වෙන්නේ



1) සිලින්ඩරයක විකසනයකි
2) කේතුවක විකසනයකි
3) පිරමීඩයක විකසනයකි
4) ප්‍රිස්මයක විකසනයකි

10) නිර්මාණයක් කිරීමේ දී නිවැරදිව ජ්‍යාමිතික උපකරණ භාවිතා කළ යුතුය. පහත රූපයට අනුව මෙම නිර්මාණය හඳුන්වන්නේ



1) ඍජුකෝණාස්‍ර ක්‍රමයට ඉලිප්ස නිර්මාණයක් ලෙසයි.
2) චාප ක්‍රමයට රොම්බස නිර්මාණයක් ලෙසය.
3) නූල් ඇදීමේ ක්‍රමයට වෘත්ත නිර්මාණයක් ලෙසය.
4) ඒක කේන්ද්‍රීය වෘත්ත ක්‍රමයට ඉලිප්ස නිර්මාණයක් ලෙසය.

11) රෙදි පිළි වර්ණ ගැන්වීම සඳහා අතීතයේ මෙන්ම වර්තමානයේ ද විවිධ ක්‍රමවේද යොදා ගැනේ. කොස් ලී වල අරටු තම්බා ලබා ගත් පඬු දියරෙන් පොඟවා බෝම්බු කොළ යොදා තැම්බීමෙන් වර්ණ ගැන්වීම කරනුයේ

1) සිවුරු වලටය
2) ලුන්ජි වලටය
3) සාරි වලටය
4) බිත්ති සැරසිලි වලටය

12) පිළි අලංකරණයේ දී වර්ණ ගැන්වීම සඳහා වර්ණ චක්‍රය පිළිබඳව මනා අවබෝධයක් ලබා ගත යුතු වේ. පහත සටහනේ දක්වන වර්ණ චක්‍රයෙහි හිස්තැන් සම්පූර්ණ කිරීමට අවශ්‍ය වන්නේ




1) දම් වර්ණයයි
2) නිල් වර්ණයයි
3) කොළ වර්ණයයි
4) සුදු වර්ණයයි

13) නිෂ්පාදිත රෙදිවලට හා කෙඳිවලට ස්වභාවිකව හා බාහිරව එකතු වන අපද්‍රව්‍ය සායම් උරා ගැනීමට බාධාවක් වන නිසා ඒවා ඉවත් කර ගැනීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ

1) පසු පිරියම්කරණය ලෙස
2) කාබනීකරණය ලෙස
3) විරංජන ක්‍රියාවලිය ලෙස
4) පෙර පිරියම්කරණය ලෙස

14) චිත්‍ර ඇඳීමේ හැකියාව ඇති අයට විවිධාකාර වූ මෝස්තර රටා ගොඩනඟා ගත හැකිය. චිත්‍ර ඇඳීමේ හැකියාව නැති අයට මෝස්තර යොදා ගැනීමට සුදුසුම මුද්‍රණ ක්‍රමය වන්නේ

1) පින්තාරු ක්‍රමය
2) සේද රාමු මුද්‍රණ ක්‍රමය
3) තාප බන්ධිත ක්‍රමය
4) ස්ටෙන්සිල් මුද්‍රණය

15) පිළි මුද්‍රණයේ දී යොදා ගන්නා අච්චු හා නිර්මිත අච්චු වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්වේ. නිර්මිත අච්චුවකට යොදා ගන්නා ලී වර්ගයේ තිබිය යුතු ගුණාංගයක් වන්නේ

1) එය කඳේ අරටුව වීමය
2) මෘදු දැව වර්ගයක් වීම
3) ලීයේ හරස් අත මුණත වීමය
4) ජලයට ඔරොත්තු දීමය

16) රෙදි වලට වර්ණ යෙදීමේ දී යොදන සායම් වර්ගය අනුව වර්ණ යෙදීමේ ක්‍රමය ද වෙනස් වේ. වර්ණ ගැන්වීමේ දී අදාළ වර්ණ කොටස් දෙකක් වශයෙන් වෙන් වෙන්ව යෙදිය යුතු සායම් වර්ණ වන්නේ

1) බ්‍රේන් තෝල් ය
2) මැටි සායම් ය
3) ප්‍රෝෂියන් ය
4) නෙප්තෝල් ය

17) පේෂ කර්මාන්තය සඳහා යොදා ගන්නා කෙඳි වර්ග දේශගුණික සාධක අනුව බොහෝ වෙනස්කම් දක්වයි. ලෝකයේ වටිනාම ලෝම වර්ගය ලබා ගන්නේ

1) දික්ලොම් බැටලුවාගෙනි
2) ඔටුවාගෙනි
3) විකුණාගෙනි
4) මස් බැටලුවාගෙනි

18) විවීමේ ක්‍රියාවලිය සිදුවන්නේ විවිධ රටාවන් අනුවය. සාරි, සරොම්, චේට්ටි, චීත්ත ආදී ඇඳුම් නිර්මාණය කරන රෙදි වර්ග සහ ඕගන්දි වොයිල් ආදී රෙදි වර්ග වියාගනු ලබන වියමන් වර්ගය වන්නේ

1) හරස්දර වියමනය
2) චාම් වියමනය
3) හාක්ක වියමනය
4) ජටා වියමනය

19) වර්තමානයේ බහුලව නූල් අංකනය කිරීම සඳහා මෙට්‍රික් ක්‍රමය යොදා ගනු ලැබේ. නූල් කිලෝ ග්‍රෑමයක (1000g) බරක මීටර් 1000 ක් දිග නූල් කැරලි 40 ක් වූයේ නම් එම නූලට ලබාදෙන අංකනය වන්නේ

1) 20 කි
2) 40 කි
3) 60 කි
4) 80 කි

20) පිරිවැය ගණනය කිරීම නිෂ්පාදන ක්‍රියාවලිය අත්‍යාවශ්‍ය වේ. නූල් හැදයක දිග මීටර් 100 ක් ද පළල සෙන්ටිමීටර් 60 ක් ද එහි දික් සෙන්ටිමීටර් 1 ක් සඳහා දික් නූල් පොටවල් 48 ක් ද යොදා ඇත. එම හැදයට වැය වන දික් නූල් පොටවල් ගණන වන්නේ

1) $100 \times 60 = 6000$ කි
2) $1000 \times 48 = 48000$ කි
3) $100 \times 48 = 4800$ කි
4) $60 \times 48 = 2880$ කි

21) වියමන් රටාවක නූල් මතුවීම විවිධ ලෙස සිදුකෙරේ. පහත දැක්වෙන වියමන් රටා අතුරෙන් $\frac{1}{4}$ නූල් මතුවීම පෙන්නුම් කරන හීරි වියමන් රටාව තෝරන්න.


i.


ii.


iii.


iv.

22) හැදයක් වියා ගැනීමේ දී එක් පුඩු ඇසකින් නූල් දෙක බැගින් යෙදීමත් සිදුකෙරෙන වියමන් රටාව මින් කුමක්ද?


i. සරල හීරි වියමන


ii. හරස්දාර වියමන


iii. දික්දාර වියමන


iv. ජටා වියමන

23) හැදයක් යන්ත්‍රගත කිරීමට පෙර කළ යුතු කාර්යය රාශියක් වෙයි. ඒ සඳහා විවිධ උපකරණ භාවිතයට ගැනේ. එතුම් රෝදය හා මල් චක්‍රය භාවිත කෙරෙන්නේ

1) හැදය වට කඳට එතීම සඳහා ය
2) දික් නූල් කුරුවලට නූල් ඔතා ගැනීම සඳහා ය
3) හැදයට සීරු යෙදීම සඳහා ය
4) හැදය දික් දැමීම සඳහා ය

24) විවීමේ දී රටාවට අනුව නූල් ඇදීම සිදු කෙරෙන්නේ පුඩුවැල් පේළිවලිනි. හීරි වියමන් රටා වියා ගැනීම සඳහා භාවිත කළ යුතු අවම පුඩුවැල් සංඛ්‍යාව වන්නේ

1) 2 කි
2) 3 කි
3) 4 කි
4) 5 කි

25) පහත රූප සටහනේ දැක්වෙන්නේ ජව නඩා යන්ත්‍රයකට යොදනු ලබන උපාංගයකි. එය හඳුන්වන්නේ



1) සීරු පොල්ල නමිනි
2) පා පොල්ල නමිනි
3) හරස් පොල්ල නමිනි
4) ලීවරය නමිනි

26) විවීමේ දී යොද ගන්නා හැදයට අනුව යොද ගනු ලබන උපකරණ විවිධ වේ. දිගින් සහ පළලින් අඩු හැදයක් දික් දැමීම සඳහා භාවිතා කිරීමට වඩාත් පහසු උපකරණය වන්නේ

1) දික් ගැසීමේ ලෑල්ල ය
2) නූල් බෙත්ම ය
3) නූල් බෙරය ය
4) වට කඳ ය

27) භාණ්ඩ නිපදවීමට භාවිත කෙරෙන මැටි හෙවත් ඇලුමනා සිලිකේට් නිර්මාණය වීම සඳහා භෞතික, රසායනික සහ ජීව විද්‍යාත්මක හේතු බලපායි. මැටි අණුවක අන්තර්ගත සංයෝග වන්නේ

1) ඇලුමිනියම් ඔක්සයිඩ්, සිලිකන් ඩයොක්සයිඩ් සහ ජලයයි
2) සෝඩියම සිලිකේට්, ඇලුමිනියම් ඩයොක්සයිඩ් සහ ජලයයි
3) පොල්ඩ්ස්පාර්, ඩොලමයිට් සහ ජලයයි
4) ටයිටේනියම්, පොටෑසියම් සහ ජලයයි

28) ප්‍රමිතිගත මැටි භාණ්ඩයක් නිපදවීම සඳහා මැටිවල අන්තර්ගත සංයෝග පිළිබඳව දැන සිටිය යුතුය. සුවිකාර්යතාව අධික මැටිවලට නියම ප්‍රමිතිය ලබාදීම සඳහා එකතු කළ යුතු වන්නේ

1) මැග්නීසියම් අඩංගු කළු මැටි වැනි මැටි වර්ගයකි.
2) ඇලෙනසුළු අමුද්‍රව්‍යයක් වන බෝල මැටි වැනි වර්ගයකි.
3) පෙල්ඩ්ස්පාර් සහ සිලිකා අඩංගු ගිනි මැටි වැනි මැටි වර්ගයකි.
4) යකඩ ප්‍රතිශතය අඩු කෙඔලින් වැනි මැටි වර්ගයකි.

29) භාණ්ඩ නිපදවීමේ දී ප්‍රධාන ඇලෙන සුලු අමුද්‍රව්‍ය ලෙස කෙඔලින් මැටි භාවිත කෙරේ. කෙඔලින් මැටි භෞතිකව හඳුනාගත හැකි සාධක මොනවාද?

1) පිළිස්සීමට පෙර දුඹුරු වර්ණය ගත්ත ද පිළිස්සීමෙන් පසු සුදු පැහැතිය.
2) පිළිස්සීමකට පෙර අළු පැහැති වුව ද පිළිස්සීමෙන් පසු සුදු පැහැතිය.
3) පිළිස්සීමකට පෙර සහ පිළිස්සීමෙන් පසු ද පැහැදිලි සුදු පැහැයක් ඇත.
4) පිළිස්සීමට පෙර සුදු පැහැති වුව ද පිළිස්සීමෙන් පසු වවිධ වර්ණ දැකිය හැකිය.

30) අවශ්‍යතාවයට අනුව මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රම භාවිතයට ගැනේ. එකම හැඩයේ එකම ප්‍රමාණයේ මැටි භාණ්ඩ රාශියක් අවශ්‍ය අවස්ථාවක ඒ සඳහා වඩාත් සුදුසු නිෂ්පාදන ක්‍රමය වන්නේ

1) සකපෝරුව ඉදිකිරීමයි
2) තහඩු භාවිතයෙන් ගොඩනැගීමයි
3) අච්චු භාවිතයෙන් තැනීමයි
4) මැටි දරණු යොද සකස් කර ගැනීමයි

31) පාසලට ඇතුළු වන ගේට්ටුව අසල තාප්පයේ රූඳවීමට මැටි මාධ්‍යයෙන් කරන කැටයමක් සඳහා වඩාත් සුදුසු ක්‍රමය වන්නේ

1) මැටි දරණු භාවිත කර ත්‍රිමාන හැඩයෙන් යුතුව කරන ලද නිර්මාණයකි.
2) සකපෝරුවේ ඉදිකර ගත් විවිධ ප්‍රමාණයේ භාණ්ඩ ඇතුළත් නිර්මාණයකි.
3) මැටි තහඩු භාවිතයෙන් කැටයම් ක්‍රම යොදා සකස් කළ නිර්මාණයකි.
4) අතින් ඇඹීමේ ක්‍රමය භාවිත කර සකස් කර ගත් රූප ඇතුළත් නිර්මාණයකි.

32) සකපෝරුව භාවිත කර අලංකාර වූ වෘත්තාකාර මැටි බඳුන් ඉදිකරගනු ලැබේ. සකපෝරුවෙන් භාණ්ඩ ඉදිකිරීමේ පළමු පියවර වන්නේ

1) මැටි පිඩ සකපෝරුව මත සවි කිරීම ය.
2) මැටි පිඩ මධ්‍යගත කර ගැනීම ය.
3) මැටි පිඩ විවෘත කිරීම ය.
4) මැටි පිඩේ වයනය ලබා ගැනීම ය.

33) භාණ්ඩ නිපදවීම සඳහා ඉහළ යකඩ ප්‍රතිශතයක් සහිත රතු මැටි බහුලව භාවිත කෙරෙන්නේ එහි ඇති සුවිකාර්යතාව නිසා ය. රතු මැටි පමණක් භාවිත කර නිපදවූ භාණ්ඩ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1) පිඟන්, පීරිසි කෝප්ප වැනි පෝසිලේන් භාණ්ඩ
2) සෝදන බේසම්, නාන ටැංකි වැනි සනීපාරක්ෂක භාණ්ඩ
3) බිම් ගඩොල්, පිඟන් ගඩොල් වැනි ඉදි කිරීම ආශ්‍රිත භාණ්ඩ
4) වලං, හට්ටි මුට්ටි වැනි මුළුතැන්ගෙයි භාණ්ඩ

34) පෝරණුවක මැටි භාණ්ඩ පිළිස්සීමේ දී විවිධ අවස්ථා පසුකරමින් පිළිස්සීමේ ක්‍රියාවලිය නිමාවට පත්වෙයි. ඔක්සිකරණ අවස්ථාවේ දී සිදුවන්නේ

1) මැටි භාණ්ඩ පිළිස්සීමේ ආරම්භයයි
2) සංයෝග වී ඇති ජලය ඉවත්ව යන අවස්ථාවයි
3) මැටි භාණ්ඩවල වර්ණය වෙනස් වන අවස්ථාවයි
4) මැටි භාණ්ඩ හැකිළීම සිදුවන අවස්ථාවයි

35) රෙදි පිළි අලංකරණයේ දී විසිතුරු මැහුම් ක්‍රම ද යොදා ගැනේ. පහත දක්වෙන මැහුම් ක්‍රම අතුරින් විසිතුරු මැහුම් ක්‍රමයක් වන්නේ

1) නූල් ඇදීම
2) පිස්මේන්තු මැස්ම
3) නූල් දුවවීම
4) ලේසි ඩේසි මැස්ම

36) අතීතයේ වටිනා ද්‍රව්‍ය වලින් සැදූ ආභරණ පැළඳීම කර ඇතත් පසුකාලීනව ආරක්ෂක හේතු හා ආර්ථිකමය වටිනාකම නිසා විකල්ප මාධ්‍ය යොදා ගනිමින් විකල්ප ආභරණ වෙත යොමු වී ඇත. විකල්ප මාධ්‍ය වලින් තැනූ ආභරණ වල වැඩිකල් පැවැත්ම සඳහා ඔබ යොදා ගත යුතු ආලේපය වන්නේ

1) ක්ලියර් වාර්නිෂ්
2) පින්තාරු කිරීමේ තීන්ත
3) ලිහිසි තෙල්
4) බයින්ඩර් ගම්

37) මිනිසා විසින් ජීවිතයේ විවිධ අවස්ථා සඳහා විවිධ මල් සැකසුම් භාවිතා කෙරේ. මෙහිදී ස්වභාවික මෙන්ම කෘතිම මල් ද බහුලව යොදා ගැනේ. ස්වභාවික මල් සැරසිලි සඳහා භාවිතා කරනු ලබන්නේ

1) රිජිෆෝම් ය
2) වෙට්ෆෝම් ය
3) ඩ්‍රයි ෆෝම් ය
4) ෆොයිල් ෆෝම් ය

38) මංගල අවස්ථා සඳහා මනාලිය වෙනුවෙන් විවිධ හැඩැති මල් පොකුරු නිර්මාණය වේ. එසේ නිර්මාණය කෙරෙන රවුම් හැඩයේ මල් පොකුරු හඳුන්වන්නේ

1) අශ්ව ලාඩමක හැඩය
2) අයිඩ්‍රොප් හැඩය
3) පෝසි හැඩය
4) දිගටි හැඩය

39) සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ සෑදීමේ හුරුව ලැබීමෙන් ඕනෑම සතෙකුගේ ආකෘති නිර්මාණයට හැකියාව ලැබේ. සතුන් නිර්මාණයේ දී මුලින්ම කළ යුතු වන්නේ

1) සුදුසු රෙදි හා පිරවුම් ද්‍රව්‍ය සපයා ගැනීමය
2) අවශ්‍ය උපාංග සමඟ නූල් ඉඳිකටු සපයා ගැනීමය
3) අවශ්‍ය ප්‍රමාණයට නිවැරදි පතරොම සැකසීමය
4) පතරොම් කොටස් වලට 1cm මැහුම් වාසි තබා රෙදි කපා ගැනීම

40) උද්‍යාන අලංකරණ නිර්මාණයේ දී අව්වැසි සුළං ආදී දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දිය හැකි ආකාරයේ නිර්මාණ සකස් කිරීමට භාවිතා කළ හැකි අමුද්‍රව්‍ය කුමක්ද?

1) මැටි
2) සිමෙන්ති
3) පල්ප
4) යකඩ